සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **6 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 6** |
| **First Term Test** | **2018** | **Grade 6** |

| | |
|---|---|
| ***දේශීය නර්තනය – I,II*** | ***පැය 1½ යි*** |
| ***Dancing - I,II*** | ***1 ½ hours*** |

නම/විභාග අංකය :- ……………………………………………………………………………………

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) නමස්කාර සරඹයේ දී පළමුව අවසර ගනු ලබන්නේ ,

i. දෙමාපියන්ගෙනි. ii. බුදුන් වහන්සේ ගෙනි. iii. ගුරුවරුන්ගෙනි. iv. දෙවියන්ගෙනි.

(2) නම්‍යතා අභ්‍යාසයේ සුවිශේෂ ලක්ෂණයක් නොවන්නේ,

i. නම්‍යශීලී බව ii. අවකාශ භාවිතය iii. සැහැල්ලු බව. iv. සංකීර්ණ බව

(3) දේශීය නර්තන සම්ප්‍රදායන් හි මූලික අංගහාරය ………………………………………… ලෙස හඳුන්වයි.

i. පා සරඹ ii. මණ්ඩිය. iii. අවකාශය iv. නමස්කාරය.

(4) පා සරඹ, මණ්ඩි පද, අභ්‍යාස කිරීමේ දී ………………………………………… උපයෝගී කරගනී

i. අත්රබාන ii.ගැටබෙරය iii.දණ්ඩි කඳ iv. උඩැක්කිය.

(5) උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්හි දී වාදනය කරන ප්‍රධාන වාද්‍යභාණ්ඩ දෙක , පිළිවෙලින්,

i. දවුල , තම්මැට්ටම ii. රබාන ,උඩැක්කිය. iii. යක්බෙරය ,ගැටබෙරය. iv. ගැටබෙරය, දවුල

(6) තෛපොංගල් උත්සවයේ දී ගෞරවාදරයෙන් පිදුම් ලබන සත්වයෙකි.

i. අශ්වයා ii. අලියා. iii. ගවයා. iv. සිංහයා

(7) ගුරු නමස්කාර ගාථාවකි.

i. ඔවාද සිප්ප ධානේන.. ii. සම්මා සම්බුද්ධ ඥානේන ... iii. තෛලෝක්‍ය තිලකං.. iv. සරස්වතී නමෝ තුය්‍යං ...

(8) නර්තනය, ගායනය, වාදනය යන අංග වලදී තාල තැබීමට සුදුසු ම වාද්‍ය භාණ්ඩය වන්නේ.

i. පන්තේරුව. ii. ගැටබෙරය. iii. තාලම්පට iv. උඩැක්කිය.

(9) පිරිමින් සඳහා සුදුස ම ගැමි නැටුමකි.

i. කළගෙඩි. ii. ලී iii. චාමර. iv. කුලු

(10) පරිසරයේ දක්නට ලැබෙන ස්වාභාවික වස්තූන් 2 කි.

i. හිරු ,සඳු ii. ගස්වැල්, වාහන iii. දියඇලි, ගොඩනැගිලි. iv. තුරුලතා, වාද්‍ය භාණ්ඩ.

➢ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න " A " තීරුවට ගැලපෙන වචනය " B " තීරුවෙන් තෝරා යාකරන්න.**

| A | B |
|---|---|
| (11) ආගමික උත්සවයකි. | තම්මැට්ටම |
| (12) දේශීය වාද්‍ය භාණ්ඩයකි. | ජලය සොදයි බැස.... |
| (13) කළගෙඩි කවියකි | වෙසක් උත්සවය. |
| (14) ජන ක්‍රීඩාවකි. | සාරධර්ම |
| (15) ගුරු ගෙදර | එළුවන් කෑම |

➢ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(16) ආධුනික ශිල්පියෙකු විසින් පළමුව අභ්‍යාස කරනු ලබන සරඹ විශේෂය ................................................................ ය.

(17) සිංහල හා හින්දු අවුරුදු සමයේ දී පරිසරයෙන් ඇසෙන්නේ ............................................................................. නාදයයි.

(18) විකල්ප හෝ ආදේශ භාණ්ඩයක් ලෙස ...................................................................................................... හඳුන්වයි.

(19) පූජාර්ථය හා විනෝදාස්වාදය මුල්කොටගත් ආගමික පසුබිමක් මත ගොඩනැගුණු උත්සවයක් ලෙස ...................... හඳුන්වයි.

(20) අතීතයේ මූලික අධ්‍යාපනය ලැබූ ආයතනය ........................................................................................... ය

(අවුරුදු උත්සවය/ තෛපොංගල් උත්සවය/ කොවුල්/ ටින්බෙරය/ගැටබෙරය/ගුරුගෙදර/පාසරඹ, මණ්ඩිපද)

(ලකුණු - 20 )

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.**

01. (i) පරිසර සුන්දරත්වය විඳිය හැකි ස්ථාන 2 ක් නම් කරන්න.

(ii) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාලව නමස්කාර පදය ලියන්න.

(iii) ශාරීරික නම්‍යතාවය ඇතිකර ගැනීම සඳහා සුදුසු අභ්‍යාස විශේෂය නම් කරන්න.

(iv) ගුරු වන්දනා කවියක් ලියන්න.

(v) ඔබ දන්නා සාමප්‍රදායික වාද්‍ය භාණ්ඩ 2 ක් ලියන්න. (ලකුණු - 10)

(02) (i) නර්තනය ඉගෙන ගන්නා පන්ති කාමරය තුළ දී අනුගමනය කරන චාරිත්‍ර විධි 2 ක් ලියන්න.

(ii) නැළවිලි කවි ගායනා කිරීමේ අරමුණු 2 ක් ලියන්න. (ලකුණු - 10)

(03) (i) ඔබ දන්නා ගැමි නැටුම් 5 ක් නම් කරන්න.

(ii) ඉන් එකකට අයත් කවියක් ලියන්න. (ලකුණු -10)

(04) (i) පරිසරයෙන් ඇසෙන ශබ්ද 5 ක් නම් කරන්න.

(ii) පරිසරය අසිරිය පිළිබඳ කියවෙන ගීතයක කොටසක් ලියන්න. (ලකුණු -10)